| කලාපය | භූමිය මායිමේ තිබිය යුතු උපරිම ශබ්ද මට්ටම ඩෙසිබල් (දිවා කාලයේදී) | (රාත්‍රී කාලයේදී) |
|---|---|---|
| ග්‍රාමීය (නේවාසික) | 50 | 40 |
| නගරාසන්න (නේවාසික) | 55 | 45 |
| නාගරික (නේවාසික) | 60 | 50 |
| නාගරික (නේවාසික) ඇතැම් වාණිජ ස්ථාන, හෝ සැහැල්ලු කර්මාන්ත සහිත) | 63 | 55 |
| විශේෂ කාර්මික කලාප | 70 | 60 |

(වෙනස්වීමට ඉඩ ඇත)

## ශබ්ද දූෂණය වැලැක්වීමට ඔබට කළහැකි දේ :-

1. ශබ්ද දූෂණය වන ක්‍රියාවලින් වැලකී සිටීම.
2. කර්මාන්තයක් ස්ථානගත කිරීමේදී අවට පරිසරය / පරිසරයේ පිහිටීම ගැන සැලකිලිමත්වීම.
3. කර්මාන්ත ස්ථානගත කරන භූමියට ප්‍රාදේශීය සභාවේ / මධ්‍යම පරිසර අධිකාරියේ අනුකූලතාවය ලබා ගැනීම.
4. ශබ්දය අවම කිරීමේ ක්‍රම හා තාක්ෂණය පිළිබඳ උපදෙස් ලබා ගැනීම හා ඒවා ක්‍රියාත්මක කිරීම.
5. උත්සව වැනි අවස්ථාවලදී ශබ්ද විකාශණ යන්ත්‍ර අධික ශබ්දයෙන් භාවිතා නොකිරීම.
6. ශබ්ද දූෂණය පාලනය කිරීමට පනවා ඇති නීති-රීතිවලට අවනතවීම.

## ශබ්ද දූෂණයට එරෙහිවීම :

ශබ්ද දූෂණයකින් තොරව ජීවත්වීමට සෑම අයෙකුටම අයිතියක් ඇත. එය පැහැර ගනු ලබන අවස්ථාවකදී පහත සඳහන් ආයතනවලට පැමිණිලි කළහැකිය.

★ ප්‍රදේශයේ පොලිස් ස්ථානයට
★ ප්‍රාදේශීය සභාවේ ඇති ප්‍රාදේශීය පරිසර සභාවට
★ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ, ප්‍රදේශීය පරිසර මෙහෙයුම් කමිටුවට
★ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, දිස්ත්‍රික් පරිසර කමිටුවට
★ පොලිස් මූලස්ථානයේ විශේෂ පරිසර ඒකකයට
★ අධිකරණයට
★ මධ්‍යම පරිසර අධිකාරියට
★ වන සම්පත් හා පරිසර අමාත්‍යාංශයේ පරිසර අංශයට

## ශබ්ද දූෂණය පාලනය කිරීමට නීති පැනවෙන ආඥා පනත්

1981 අංක 47 දරණ ජාතික පාරිසරික පනත

1988 අංක 56 දරණ ජාතික පාරිසරික (සංශෝධිත) පනත

1962 අංක 15 දරණ මහජන පීඩා ආඥා පනත

(මීට අමතරව පොලිස්පති විසින් නිකුත් කොට ඇති
1994.07.09 දිනැති අංක 1155/94 සහ
1995.03.20 දිනැති අංක 1196/95 දරණ චක්‍රලේඛ මගින්
පොලිස් ස්ථානවලට ද අවශ්‍ය උපදෙස් ලබාදී ඇත.

**අද ජීවත්වන ඔබට පමණක් නොව මතු උපදින දරු මුණුපුරු පරම්පරාවන්ටද පිවිතුරු පරිසරයක මිහිර ආශ්වාදනය කිරීමට ඇති අයිතිය සුරැකීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර ප්‍රවර්ධන අංශය මගින් ජනාවබෝධය වැඩිදියුණු කිරීම උදෙසා නිකුත් කරනු ලබයි.**


මධ්‍යම පරිසර අධිකාරිය
මාලිගාවත්ත නව නගරය
කොළඹ 10.
දුරකථන අංකය : 437487-9
පරිසර ප්‍රවර්ධන අංශයේ ප්‍රකාශනයකි
පත්‍රිකා අංක 9/97 (R.P.)




# පරිසරය වනසන ශබ්ද දූෂණය